**සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම - 2016**

**-----------------------------------------------------------**

සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම

**-----------------------------------------------------------**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලයේ") වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණන මතය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිතිය අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණනය සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

**-----------------------------------------------------------**

(අ) බදු ගණනය කිරීමේ විස්තර හා බදු වාර්තා යනාදී ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි නොමැතිවීම නිසා මූල්‍ය ප්‍රකාශනවල සටහන් 10 හා 14 හි දැක්වෙන ආදායම් බදු, ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සහ වැට් පිළිවෙලින් රු. 11,703,151 , රු. 3,371,326 හා රු. 12,758,801 ක් වූ ගෙවියයුතු බදු සහ එකතුකළ අගය මත බදු (VAT) , ආර්ථික සේවා ගාස්තු (ESC) හා

රඳවාගැනීමේ බදු පිළිවෙලින් රු. 26,506,918 ක් , රු. 894,150 ක් හා රු. 77,718 ක් වූ ලැබියයුතු බදු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

එසේම, එකතු වටිනාකම රු. 65,474,540 වූ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 17 යටතේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස දැක්වෙන ආදායම් බදු වගකීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්තාවල දැක්වෙන ශේෂය සමඟ එකඟ නොවුණි. තවද, බදු වාර්තා හා ගණනය කිරීම් ආදී විස්තර නොමැතිවීම නිසා එම වගකීම්වල විශ්වාසනීයත්වය හා නිරවද්‍යතාවය විගණනයේදී සියුම් ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා නැව් සංස්ථාවට ගෙවියයුතු මුදල රු. 170,378,808 ක් වූ නමුත් සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් ලද ශේෂ සනාථ කිරීම් අනුව එම ශේෂය රු. 788,958,985 ක් ලෙස දැක්විණි. මේ නිසා එම වාර්තා දෙක අතර රු. 618,580,177 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය. එමනිසා මෙම ශේෂයෙහි නිරවද්‍යතාවය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ විස්තර කරනු ලබන කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින්, 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**කරුණු අවධාරණය**

2013 සැප්තැම්බර් 05 දින සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය (CEB) අතර ඇතිකරගන්නා ලද ගිවිසුම ප්‍රකාරව, විදේශ වෙළඳපලෙන් ගල්අඟුරු ප්‍රසම්පාදනය සමාගමේ ප්‍රධාන කාර්යය (සමාගම විසින් තම නමින් විවෘත කරනු ලබන ණයවර ලිපි සඳහා ලංවිම ගෙවීම් කරනු ලැබේ) වන අතර කිසිදු ලාභ ආන්තිකයක් තබාගැනීමෙන් තොරව ඒවා නැවත ලංවිම වෙත අලෙවි කරනු ලැබේ. තවද, සමාගම විසින් උපයන ලද වෙනත් කිසියම් ආදායමකට හිලව් කිරීමෙන් පසු ඉතිරිවන සමාගමේ සියළු මෙහෙයුම් වියදම (සමාගමේ ශුද්ධ පොදු කාර්යය පිරිවැය) ලංවිම විසින් සපුරනු ඇත. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවල එහි ප්‍රධාන කාර්යයන්ගෙන් පැණනැගුනු විකුණුම් ආදායම, විකුණුම් පිරිවැය හා මෙහෙයුම් වියදම ආදිය හඳුනාගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි.

**2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් අවශ්‍ය වන පරිදි, පහත කරුණු දක්වමි.

(අ) විගණනයෙහි මතය සඳහා පදනම සහ විෂයපථය හා සීමාවන් ඉහත දක්වන පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල බවත් වේ.

## 2.2 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2015 මැයි 25 දිනැති අංක. පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව, ප්‍රවාහන දීමනා ලෙස 2016 වර්ෂය සඳහා සමාගමේ නිලධාරීන් 03 ක් සඳහා රු.600,000 ක් වැඩියෙන් ගෙවීම්කර තිබුණි. |
| (ආ) | 2016 ඔක්තෝබර් 19 දිනැති අංක. පීඊඩී 4/2016 (1) හා 2016 ඔක්තෝබර් 27 දිනැති අංක. පීඊඩී 1/2015(1) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | කල්බදු පදනම යටතේ සභාපතිවරයා විසින් වාහනයක් ලබාගෙන තිබූ අතර සමාගම විසින් රු.195,000 ක මාසික කුලියක් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, තම පුද්ගලික වාහනය සඳහා ප්‍රවාහන දීමනාව ලබාගන්නා සාමාන්‍යාධිකාරීවරයාට සමාගමේ රියදුරු සංචිතයෙන් රියදුරෙකු චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව අනුයුක්ත කර තිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂය සඳහා ඉන්ධන දීමනාව ලෙස රු.454,743 ක් සභාපතිවරයාට ගෙවීම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී සමාගම විසින් අධිවේගී මාර්ග බිල්පත් ලෙස රු.51,000 ක් ප්‍රතිපූරණය කර තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අනුමත වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණ යෝජනා ක්‍රමයක් සමාගමේ නොතිබුණද සමාලෝචිත වර්ෂය තුලදී වෛද්‍ය වියදම් ලෙස සමාගමේ සේවකයන්ට රු.1,014,176 ක් ප්‍රතිපූරණය කර තිබුණි. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006<br>එන්පීඒ චක්‍රලේඛ අංක: (08)<br>(i) 8.9.3 මාර්ගෝපදේශය | වටිනාකම රු. මිලියන 500 ඉක්මවන ප්‍රසම්පාදන ගිවිසුම් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අත්සන් කළයුතු නමුත් සමාගම ආරම්භයේ සිටම සභාපති විසින් උක්ත වටිනාකම ඉක්මවූ ගල්අගුරු ප්‍රසම්පාදන ගිවිසුම් අත්සන් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (i) | 8.8 මාර්ගෝපදේශය | අනාගතයේදී තරඟකාරී හා වඩාත් ප්‍රතිචාරාත්මක ලංසු යොමු කිරීමට ලංසුකරුවන් දැනුවත් කිරීමේ සමස්ථ අරමුණ ඇතිව අසාර්ථක ලංසුකරුවන්ට ඔවුන්ගේ අඩුපාඩු සාරාංශ කර දැන්වියයුතු වුවත් මාර්ගෝපදේශයේ උපදෙස් අනුව, සමාගම විසින් සිදුකළ සියළු ප්‍රසම්පාදන වලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | (i) අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවූ දීමනාවලට අදාල PAYE බදු අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවා නොතිබුණි.<br>(ii) 2014/2015 වර්ෂයට අදාල රේටයන්ට අනුව 2015/2016 වර්ෂයට අදාල උපයන විට ගෙවීමේ බදු අඩුකර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පසුගිය වර්ෂයේ සිට සමාගම විසින් දරන ලද ශුද්ධ පොදුකාර්ය පිරිවැය ප්‍රතිපූරණය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය ඊට අනුරූපී ඉකුත් වර්ෂය ප්‍රකාරව බදුවලට පෙර ශුද්ධ ලාභයක් හෝ ශුද්ධ අලාභයක් නොවූණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**4.1.2 මෙහෙයුම් හා සමාලෝචනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගල් අඟුරු තාප විදුලි බලාගාරයන් සඳහා අවශ්‍ය ගල් අඟුරු මිලදීගැනීමේ නිශ්චිත කාර්යය ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා කෝල් සමාගම පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද සමාගම පිහිටුවීමේ අරමුණු වලින් බැහැර වූ එහි විෂයපතයට පරිබාහිර අරමුණු වන පාර්ලිමේන්තු පනත් මගින් වෙනත් රාජ්‍ය ආයතනවලට පවරන ලද සමහරක් කාර්යයන් ලංකා කෝල් සමාගම තමන්ට පවරාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2015 සැප්තැම්බර් 01 දින සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව, ලංකා කෝල් සමාගම දරනු ලබන ශුද්ධ පොදුකාර්යය පිරිවැය ලං.වි.ම. ප්‍රතිපූරණය කරනු ලැබේ. එමනිසා, සමාගමේ කාර්යසාධනය මැනීමට වාර්ෂික ලාභය හෝ අලාභය සැලකිය නොහැකි අතර බොහෝ ව්‍යාපාර කටයුතු සඳහා ව්‍යාප්ත වීමට සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් බලය ලබාදී ඇත. කෙසේ වුවද, ලංකා කෝල් සමාගම එහි සංස්ථාපනයෙන් පසු එහි ව්‍යාපාර කටයුතු පුළුල් කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගම සහ ලිබර්ටි කොමෝඩිටීස් (පුද්ගලික) සමාගම (එල්සීඑල්) අතර ඇතිකරගන්නා ලද ගල් අඟුරු සැපයීමේ ගිවිසුමෙහි ගල් අඟුරුවල ප්‍රමිතිය සඳහා මිල ගැලපීමට අදාල නිවැරදි සමීකරණයක් ලංසු ලියවිලි වල ඇතුළත්ව නොතිබුණි. ඒ හේතුවෙන්, 2015 හා 2016 වර්ෂවල පිළිවෙලින් රු.83,520,248 ක හා රු.149,673,070 ක අධි ගෙවීමක් සමාගම සිදුකර තිබුණි. කෙසේ වුවද, අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු (අ.ප.ස්.ප්‍ර.ක.) විසින් ලිබර්ටි කොමෝඩිටීස් සමාගම දැනටමත් තහනම් කර තිබුණු අතර ස්ථානීය ටෙන්ඩරවලට අදාල රු. 233,193,318 ක්වූ වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට බේරුම් කිරීමේ කටයුතු ක්‍රියාවට නංවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඒ මත දරන ලද නීති ගාස්තුව රු. 8,138,790 විය. තවද ලිබර්ටි කොමෝඩිටීස් සමාගම, ගල් අඟුරු සැපයුම්කරුවෙකු ලෙස එස්අයිඑම්ඊසී සමූහ සමාගමේ ආශ්‍රිත සමාගමක් ලෙස ලියාපදිංචිවී තිබුණු බව නිරීක්ෂණය විය. තවද, එස්අයිඑම්ඊසී සමාගමේ එක් අධ්‍යක්ෂවරයෙකු ලිබර්ටි කොමෝඩිටීස් සමාගමේ සාමාන්‍යාධිකාරීවරයා විය. ඔහු ස්ථානීය ටෙන්ඩරවල අවසරලත් බලධාරියා වී තිබූ අතර ලංකා කෝල් සමාගමෙහි නේවාසික බලයලත් නිලධාරියාද විය. ලන්ඩනයේ, ඩුබායි හා හොංකොං වල ලං.කෝ.ස. හි හා එස්අයිඑම්ඊසී සමාගමෙහි නිල ලිපිනය එකම විය. අදාල ස්ථානීය ටෙන්ඩර සඳහා එස්අයිඑම්ඊසී සමාගම සහභාගීවී තිබුණු අතර තහනම් කළ සැපයුම්කරුවෙකු ආශ්‍රිත පාර්ශවයක් ලෙස ලියාපදිංචි කිරීම සැක සහිත විය.

(ආ) ලංකා විදුලිබල මණ්ඩලය සහ සමාගම අතර ඇතිකරගෙන තිබුණු ගිවිසුම ප්‍රකාරව, ගල් අඟුරු ප්‍රසම්පාදනයට අදාල වියදම් පමණක් ප්‍රතිපූරණය කළ හැකි විය. කෙසේ වුවද, 2015 හා 2016 වර්ෂ වලට අදාල එකතු වටිනාකම රු. 3,270,000 වූ සමාගම විසින් ප්‍රදානය කරන ලද පරිත්‍යාග හා අනුග්‍රාහකත්වයන්ද ප්‍රතිපූරණය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) සීමාසහිත ලංකා නැව් සංස්ථාව (සීඑස්සීඑල්) විසින් ගල් අඟුරු (මෙට්‍රික් ටොන් 59,019) ආනයනයට අදාල වැට් (VAT) සම්බන්ධයෙන් රු. 26,506,918 ක අධිගෙවීමක් සිදුකර තිබුණි.

(ඇ) ගල් අඟුරු බෑම සිදුකරන වරායේදී නිකුත්කරනු ලබන තත්ත්ව විශ්ලේෂණ වාර්තාව සලකාබැලීම වෙනුවට පැටවීම සිදුකරන වරායේදී නිකුත්කරනු ලබන තත්ත්ව විශ්ලේෂණ වාර්තාව ප්‍රකාරව ගල් අඟුරු මිලගණන් ගැලපීම් සිදුකර තිබුණි. කෙසේ වුවද, බෙහෝ අවස්ථාවල බෑම සිදුකරනු ලබන වරායේ තත්ත්ව විශ්ලේෂණ වාර්තාවේ ගල් අඟුරුවල තත්ත්වය ගල් අඟුරු පැටවීම සිදුකරන වරායේ තත්ත්ව විශ්ලේෂණ වාර්තාවේ ගල් අඟුරුවල තත්ත්වයට වඩා අඩු විය. ශුද්ධ තාපජනක අගය (ජීසීවී) හා අළු සංයුතියට අදාලව රු. 184,256,892 ක දඩ අයකළ හැකිව තිබුණද, පැටවීම සිදුකරනු ලබන වරායේ තත්ත්ව විශ්ලේෂණ වාර්තාව අනුව මිලගණන් ගැලපීම් සිදුකර තිබීම නිසා අයකරගැනීම් සිදුකළ නොහැකි විය.

(ඉ) පසුගිය ටෙන්ඩර් කොන්දේසිවල පවතින කැටවල ප්‍රමාණය මත දඩ මුදලක් යොදා තිබුණද, ස්ථානීය ටෙන්ඩර් වලදී එය ඉවත් කර තිබුණි. එම හේතුවෙන්, 2016 වර්ෂයේ දැරීමට සිදුවූ පාඩුව රු. 461,453,005 ක් විය.

## 4.3 ප්‍රසම්පාදන කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් (සීඑස්සීඑල්) 2011 වර්ෂයේ අවස්ථා දෙකකදී තාප හා ප්‍රයෝජනයට නොගන්නා ගල් අඟුරු (Deaf Coal) මෙට්‍රික් ටොන් 135,433 ක ඇණවුමක් සිදුකර තිබුණද, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව, වටිනාකම රු. 539,192,078 වූ තාප හා ප්‍රයෝජනයට නොගන්නා ගල් අඟුරු මෙට්‍රික් ටොන් 37,531 ක් ලංවිම ට සැපයුම් කර නොතිබුණු අතර මෙම වාර්තාවේ දිනය වනවිටද සපයා නොතිබුණු ගල් අගුරු තොගය සීඑස්සීඑල් සමඟ නොසැසදී තිබුණි.

(ආ) සමාගම විසින් ගල් අඟුරු බෑම සිදුකරනු ලබන වරායෙන් ලබාගන්නා විශ්ලේෂණ වාර්තා එස්ජීඑස් ලංකා (පුද්ගලික) සමාගමෙන් ලබාගෙන තිබූ නමුත් සියළු අවස්ථා වලදී මෙන්ම, ගල් අඟුරු සැපයුම්කරුවන්ද ගල් අඟුරු පැටවීම සිදුකරන වරායෙන් ලබාගන්නා විශ්ලේෂණ වාර්තා එස්ජීඑස්හි උප සමාගම් වෙතින් ලබාගෙන තිබුණි. සැපයුම්කරුවන් ලබාගන්නා තත්ත්ව විශ්ලේෂණ වාර්තා එස්ජීඑස් සමූහයෙන් ලබාගැනීම වැලැක්වීමට ගිවිසුම් වල කොන්දේසි ඇතුලත් කර නොතිබුණි. වාර්තා දෙකම එස්ජීඑස් සමූහයෙන් ලබාගැනීම විශ්ලේෂණයේ ස්වාධීනත්වයට හා වාර්තාවේ නිරවද්‍යතාවයට බලපෑමට ඉඩ ඇත.

(ඇ) එක් එක් ටෙන්ඩරය පිරිනැමීමෙන් පසු එළෙඹන ප්‍රථම රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබගත යුතුය යන කොන්දේසියට යටත්ව ටෙන්ඩර් පිරිනැමීම සඳහා 2015 ජුලි 22 දින පැවති රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. කෙසේ වුවද, ප්‍රසම්පාදන සඳහා ආවරණ අනුමැතිය මාස 04 සිට මාස 12 දක්වා ප්‍රමාදයක් සහිතව ලබාගෙන තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

-----------------------------------------

ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීගේ විෂයපථය, ස්වභාවය හා වගකීම සමාගමේ සාමාන්‍යාධිකාරීගේ විෂයපථය, ස්වභාවය හා වගකීමට වඩා පුළුල් වුවද අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය ප්‍රකාරව සමාගමේ සාමාන්‍යාධිකාරීගේ වැටුප ලංවිම යේ සාමාන්‍යාධිකාරීගේ වැටුප හා සමානව ස්ථාපිත කළයුතු විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා රු. 3,472,560 ක් ඔහුට ගෙවා තිබුණි. කෙසේ වුවද, පාලක මණ්ඩලය ගත් තීරණයේ නිරවද්‍යතාවය සැක සහිත වුවක් විය.

## 4.5 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විධිමත් බඳවාගැනීමේ පටිපාටියක් නොමැතිව (SOR) සේවක බඳවාගැනීම් සිදුකර තිබුණි.

(ආ) ලංකා විදුලිබල මණ්ඩලයේ වැටුප් පරිමාණයන්ට අනුව සමාගමේ සේවකයින්ට ගෙවීම් කර තිබුණි.

(ඇ) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ (බී) ඡේදය ප්‍රකාරව, "විශේෂිත අවස්ථා වලදී අත්‍යාවශ්‍ය තනතුරු ඇතිකිරීම, අදාල තනතුරට බඳවාගැනීම, එසේම සේවා අවශ්‍යතා අනුව විචේචනාත්මක තනතුරු සඳහා පුරප්පාඩු පිරවීම, ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන තිබීම පිළිබඳවද ඇගයීමෙන් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (DMS) පූර්ව අනුමැතිය ප්‍රකාරව පමණක් සිදුකළ යුතුය"

කෙසේ වුවද, කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව නව තනතුරු හතක් ඇතිකරමින් 2017 ජනවාරි 05 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ සංවිධාන ව්‍යුහය සංශෝධනය කර තිබුණු අතර 2016 වර්ෂයේ සේවකයින් තිදෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඈ) සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා අයදුම්පත් කැඳවීම මගින් නිසි බඳවාගැනීමේ හා තෝරාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් තොරව සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී සේවකයින් පස්දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඉ) සේවකයින් කිහිපදෙනෙකු බඳවාගැනීමේදී හා රාජකාරි හා වගකීම් වෙනස් කිරීමේදී සමාගම විසින් රැකියා විස්තරයක් ලබාදී නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

සාමාන්‍ය අවශ්‍යතා සඳහා සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවය පදනම් කර තාවකාලික කාලසටහනක් පිළියෙල කර තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය අංශයක් පිහිටුවා නොතිබුණු අතර 2016 වර්ෂය තුල අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයද විගණනයක් සිදුකොට නොතිබුණි.

### 5.3 විගණන කමිටුව

2015 වර්ෂය තුලදී සමාගම විසින් විගණන කමිටුව පිහිටුවා තිබුණු නමුත් මේ දක්වා විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5.4 සමාජ වගකීම

ලක්විජය තාප බලාගාරයේ දහනයෙන් ඉතිරිවන අළු බලාගාර භූමිය තුලම ඉවතලනු ලබන අතර පාරිසරික බලපෑමක් ඇතිවී තිබුණි. එමනිසා, පරිසර හිතකාමී ලෙස අළු අපහරණය කළමනාකරණය සඳහා ව්‍යාපෘතියක් සමාගම ආරම්භ කර තිබුණු අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා කාර්මික තාක්ෂණ ආයතනය විසින් සිදුකරන ලද පරීක්ෂණ අනුව නිෂ්පාදනය පිළිගත හැකි විය. කෙසේ වුවද, ආයෝජනය කළ අරමුදල් අපතේ යවමින් ව්‍යාපෘතිය නවතාදමා තිබුණු අතර පාරිසරික ගැටලුවද අඛණ්ඩව සිදුවීමට ඉඩහැර තිබුණි.

## 5.5 අයවැය පාලනය

(අ) අයිතම් 25 ක අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 20 සිට සියයට 1,596 ක පරාසයක සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර එමනිසා අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගැනීමට නොහැකිව තිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනයක්, වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක්, වර්ෂය අවසානයට මුල්‍ය තත්ත්ව විස්තරයක් සහ අයවැයගත ප්‍රාග්ධන වියදම් ප්‍රකාශනයක් සමඟ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂික අයවැයට ඇතුළත් වියයුතුය. කෙසේ වුවත්, සමාගම එම අවශ්‍යතාවයන්ට අනුගතවී නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගෙවීම් | ගෙවීම් කිරීමට පෙර වවුචර්පත් නිසිලෙස සහතික නොකිරීම හා චෙක්පත් අංක අනුපිළිවෙලට ගෙවීම් වවුචර්පත් සම්පූර්ණකර නොතිබුණි. |
| (ආ) ණයගැතියෝ/ණයහිමියෝ | ණයගැතියෝ හා ණයහිමියෝ පිළිබඳ නිසි පාලනයක් නොවීම. |
| (ඇ) ස්ථාවර වත්කම් | (i) ස්ථාවර වත්කම් සහ ඉන්වෙන්ට්‍රි ලේඛණ නඩත්තු නොකිරීම.<br>(ii) සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් සමීක්ෂණ සිදුකර නොතිබීම.<br>(iii) ස්ථාවර වත්කම් සඳහා හඳුනාගැනීමේ ලේබල භාවිතා නොකිරීම. |
| (ඈ) වැඩ බෙදීම | වැඩ බෙදීම් සිදුනොකිරීම |
| (ඉ) මුදල් කළමනකරණය | සැලකියයුතු මුදල් ප්‍රමාණයක් අක්‍රිය ගිණුමක පැවතීම. |
| (ඊ) වැටුප් කළමනාකරණය | වැටුප් කළමනාකරණය පිළිබඳ නිසි පාලනයක් නොවීම. |
| (උ) ගිණුම්කරණය | පරිගණක පද්ධතියේ නිසි ගිණුම්කරණ පාලන ක්‍රම අනුගමනය කර නොතිබීම. |